21 පාඩම - මිණි ගණ සඳෙස් වැණුමෙන්

➢ **ඉගනුම් ඵල :-**

- නියමිත පාඩම කියවයි. අවබෝධ කර ගනියි.
- එක් එක් සන්දේශ කතුවරු සැඳෑ අසිරිය පිළිබඳව කරන විස්තරයන්හි සමාන අසමානතා හඳුනා ගනියි.
- තාලානුරූපව නියමිත කවි ගායනා කරයි. කට පාඩම් කර ගනියි.

1. පෙළ පොතේ 21 වන පාඩම කියවා අවබෝධ කර ගන්න.
2. එහි සඳහන් සන්දේශ පිළිබඳව තොරතුරු සටහන් කර ගන්න.
3. නියමිත පද්‍ය ශබ්ද නගා ගායනා කරන්න.
4. ඔබ සිත් ගත් කවි පංතිය තෝරා ගන්න.
5. පෙළ පොතේ ඇති අනෙකුත් සන්දේශ වලට වඩා ඔබ තෝරාගත් සැඳෑ වැනුම තුළ දක්නට ඇති සුවිශේෂී ලක්ෂණ සඳහන් කරන්න.
6. එම සැඳෑ වැනුම් වලට අනුව සැඳෑ අසිරිය පිළිබඳව ඔබට හැගෙන දේ ලියන්න.
7. කෝට්ටේ යුගයේ සන්දේශ පිළිබඳව වැඩිහිටියෙකුගෙන් අසා දැනගන්න. නැතහොත් අන්තර්ජාලයට පිවිසෙන්න.

- **ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක :-**
  - ගිරා සන්දේශය , අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන, හංස සන්දේශය

<u>ඇගයීම</u>

❖ පාඩමේ ඇතුළත් සන්දේශ හතර පිළිබඳ ඇතුළත් පහත වගුව සම්පූර්ණ කරන්න.

දූතයා	සන්දේශයේ නම	කතුවරයා	ඇතුළත් පද්‍ය ගණන
මොණරා			
පරවියා			
හංසයා			
සැළලිහිණියා			

❖ පහත දැක්වෙන යුගයන්ට අයත් සන්දේශ සාහිත්‍ය කෘති නම් කරන්න.

1. ගම්පොළ යුගය :- .....
2. කෝට්ටේ යුගය :- .....
3. සීතාවක යුගය :- .....